# ලංසු ආකෘති පත්‍ර පිරවීම සඳහා උපදෙස් හා ලංසු කොන්දේසි

පහත සඳහන් ලංසු කොන්දේසි හා නියමයන්ට එකඟවන්නේනම් පමණක් ලංසු ඉදිරිපත් කිරීමට කාරුණික වන ලෙස ආරාධනා කරන අතර, එහිදී යම් අපැහැදිලිතාවයක් පවතී නම් ඒ සඳහා **2026.03.05** දින පවත්වනු ලබන පූර්ව ලංසු සාකච්ඡාවේදී සාකච්ඡා කිරීමට හැකියාව පවතී

1. රුපියල් මිලියන 05 වැඩි වටිනාකම් සහිත ලංසු සඳහා සමාගම් රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් ලබා ගන්නා ලද පොදු කොන්ත්‍රාත් ගිවිසුමේ පිටපතක් අමුණා ඉදිරිපත් කල යුතුය.(PCA 3) ඒ අනුව සියලුම පැකේජ් සඳහා වෙන් වෙන් වශයෙන් පොදු කොන්ත්‍රාත් ගිවිසුම ඉදිරිපත් කල යුතුය.

2. ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ඉහත වගුවේ සඳහන් රෝහල් සහ ආයතන වල ආරක්ෂක සේවා සැපයීම සඳහා ලංසු ඉදිරිපත් කළ යුතුය. (අවශ්‍ය වන සේවක සංඛ්‍යාව ඇමුණුම් අංක III මඟින් දක්වා ඇත)

3. ලංසු ආකෘති පත්‍ර සමඟ පහත සඳහන් ලියකියවිලි නොඅඩුව හා සම්පූර්ණව පිළිවලින් ඉදිරිපත් කළ යුතුය.

   I. ලංසු අයදුම්කරුගේ ප්‍රකාශය - ඇමුණුම් අංක I
   II. ලංසු ආකෘති පත්‍රය - ඇමුණුම් II
   III. ව්‍යාපාර ලියාපදිංචි කිරිමේ සහතිකය (අයිතිකරුවන්, කොටස්කරුවන් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් සහ විස්තර සහිතව)
   IV. මිල ගණන් ඉදිරිපත් කිරීමේ සාරාංශය - ඇමුණුම IV
      - වාර්ෂික ශ්‍රම පිරිවැය ගණනය කිරීම, පාලනමය සේවාවන් - IV – (I)
      - වාර්ෂික ශ්‍රම පිරිවැය ගණනය කිරීම, ක්‍රියාකාරී සේවාවන් - IV – (II)
   V. ලංසු බැදුම්කරය
   VI. ආදායම් බදු ගෙවන බව සනාථ කරන ලේඛන
   VII. පසුගිය ආසන්න වර්ෂ දෙකක ආයතනයේ වාර්ෂික විගණිත ගිණුම් ප්‍රකාශන (2023 හා 2024)
   VIII. පඩි පාලක සභා ආඥාපනත, සේවක අර්ථ සාධක අරමුදල් පනත, සේවක භාරකාර අරමුදල් පනත, ප්‍රසූතිකාගාර පනත, පාරිතෝෂික පනත හා කම්කරු වන්දි ආඥාපනත යටතේ ගෙවිය යුතු දීමනා නිසි පරිදි ගෙවනු ලබන බව සනාථ කරන ලේඛන
   IX. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සන්නද්ධ සේවාවන් හා පොලිසියේ සේවාවන් හැරගිය පුද්ගලයන් සේවයේ යොදවා නොමැති බවට සහතිකයක් (ලංසුකරු විසින්)
   X. මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාල කාර්යය මණ්ඩලය සපයා ගැනීමට ඇති හැකියාව සහතික කරන ලිපියක් (ලංසුකරු විසින්)
   XI. ප්‍රවර්ථන වර්ෂය සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශයේ ලියාපදිංචි සහතිකය

4. එක් ලංසුකරුවෙකුට ඉදිරිපත් කළ හැකි වනුයේ එක් එක් පැකේජ් සඳහා එක් ලංසුව බැගින් පමණි. කුමන හෝ ආකාරයකින් ලංසුපත් එකකට වඩා ඉදිරිපත් කොට තිබේ නම් එසේ ඔහු විසින් ඉදිරිපත් කරනු ලබන සියලුම ලංසු අවලංගු කිරිමට යටත් වේ. ඉදිරිපත් කරනු ලබන ලංසු 2026.06.17 දින දක්වා වලංගු විය යුතුය.

5. ලංසු අයදුම්පත්‍රය හා අදාල කරුණු සියලු ලේඛන යථා පරිදි සම්පූර්ණ කොට අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

6. ලංසු ආකෘති පත්‍රය සමඟ එක් එක් රෝහල් වලට / ආයතනයට ඉහත වගුවේ සඳහන් වටිනාකමට සමාන මුදලක් ලංසු සුරක්ෂණ ගාස්තු වශයෙන් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ මහජන බැංකු ජංගම ගිණුම් අංක 269-100188440649 තැන්පත් කර ලබාගත් බැංකු ලදුපත ඉදිරිපත් කර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ මුදල් සහකාර වෙත ඉදිරිපත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියේ පිටපතක් හෝ බැංකු ඇපකරයක් ඉදිරිපත් කරන්නේ නම් වගුවේ සඳහන් මුදලකට සරිලන පරිදි ගාස්තුවකට යටත්ව පිළිගත් වානිජ බැංකුවක් මඟින් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නමට ලියන ලද 2026.07.17 දින දක්වා වලංගු කොන්දේසි විරහිත නියමිත ආකෘතිපත්‍රය අනුව ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය. (නියමිත ආකෘතිය මේ සමග අමුණා ඇත)

7. සාර්ථක ලංසුකරු වෙත ලංසු ප්‍රධානය කිරීමේ ලිපිය නිකුත් කර, වැඩකරන දින 14 ක් ඇතුළත කොන්ත්‍රාත්තුවේ වාර්ෂික වටිනාකමින් 5% ක වටිනාකමකින් යුතු මුදලක් සඳහා ඉල්ලූ විගස ගෙවනු ලබන කොන්දේසි විරහිත කාර්ය සාධන බැඳුම්කරයක් පිළිගත් බැංකුවකින් ලබාගෙන ඉදිරිපත් කළ යුතුය. (ප්‍රසම්පාදන අත්පොත - 2024 හි 5.19 වගන්තියට අදාළ 05 වන පරිච්ඡේදය : ඇමුණුම IX ආකෘතිය) නැතහොත් ඒ වෙනුවට මුදලින් තැන්පත් කළ හැකිය.

8. සාර්ථක ලංසුකරු වෙත ලිඛිතව දැනුම් දුන් දින සිට වැඩ කරන දින 14ක් ඇතුළත එයට ප්‍රතිචාර නොදක්වන ලද්දේ නම් ඊළඟට සුදුසුකම්ලත් ලංසුකරුවන්ට කොන්ත්‍රාත්තුව ලබා දීම පිළිබඳව සලකා බැලීමට ප්‍රසම්පාදන මණ්ඩලයට බලය ඇත. ලංසු ප්‍රදානය කිරිමෙන් පසුව සාධාරණ හේතු නොමැතිව එය භාර ගැනීම ප්‍රතික්ෂේප කරන ලංසුකරුවන්ගෙන් ලංසු ඇපකරය රාජ සන්තක කරනු ලබන අතර අදාල ලංසුකරුවන් අසාදු ලේඛන ගත කිරීමට පියවර ගනු ලැබේ.

9. සාර්ථක ලංසුකරු ගිවිසුම් බලධාරියා වන පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සමග වාර්ෂික කොන්ත්‍රාත්තුව නිසි අයුරින් පවත්වා ගෙන යන බවට ගිවිසුමකට බැඳිය යුතුය.

10. කොන්දේසි වලින් ආවරණය නොවුන යම් කරුණක් ඇතොත් එය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ අභිමතය පරිදි තිරණය වේ.

11. සාධාරණ හා නිත්‍යානුකුල හේතුන් මත මෙම ටෙන්ඩරය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරිම හෝ අවලංගු කිරිමේ බලය ප්‍රසම්පාදන මණ්ඩලය සතුය.

12. ලංසු ප්‍රදානය කිරිමෙන් පසු වෙනත් කෙනෙකුට පැවරීම හෝ අතුරු බදු දීම සපුරා තහනම්ය.

13. ලංසුපත් වල සටහන් කරන ලද යම් දෙයක් කපා, මකා හෝ වෙනස් කළහොත් ඒ සෑම ස්ථානයකම ලංසුකරුගේ කෙටි අත්සන් යෙදිය යුතුය

14. ලංසුකරු ගෙවීම් ලේඛනය ඉදිරිපත් කිරිමෙන් පසු පවරා ඇති සෑම අංශයකම වැඩ කටයුතු සතුටුදායක අන්දමින් ඉටුකර තිබෙන බවට අදාළ නිලධාරින් සහතික කිරිමෙන් පසුව ලංසුකරුට අදාළ ගෙවීම් සිදු කරනු ඇත.

15. කොන්ත්‍රාත්කරු යටතේ සේවයේ යොදවන ලද සේවකයින් කම්කරු දෙපාර්තමේන්තුවේ සියළු නිතී රීති වලට අනුකූලව සේවයේ යෙදවිය යුතු අතර ඔවුන්ට වැටුප්, නිවාඩු දින වැටුප්, අතිකාල, පාරිතෝෂික, ප්‍රසූතිකාගාර, සේවක අර්ථසාධක අරමුදල, දායක සේවක භාරකාර අරමුදල් දීමනා හා වෙනත් සියළුම ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම් පිළිබඳ වගකීම ආරක්ෂක සේවා සැපයිමේ කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතු වේ. මේ පිළිබඳව වගකීමට ඌව පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හෝ ඒ යටතේ පවත්නා ආයතනය බැඳී නොසිටි. අවශ්‍ය අවස්ථාවලදී නියමිත පරිදි වැටුප් හා දීමනා ගෙවනු ලබන බවට තහවුරු කිරීමට අදාල ලේඛණ ලබාදීමට ගිවිසුම්කරු බැඳී සිටි.

16. ආරක්ෂක සේවා සැපයීම පරික්ෂා කිරිමේ බලය ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පැවරු නිළධාරින්ද ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පැවරු නිලධාරින්ද සතුවේ. ඔවුන් කලින් කලට සේවයේ අවශ්‍යතාවය මත දෙනු ලබන උපදෙස් හා නියෝග වලට අනුකුලව කටයුතු කිරිමට සේවා සැපයුම්කරු බැදී සිටී. අදාල උපදෙස් හා නියෝග ලිඛිතව ලබා දෙනු ඇත.

17. ඉහත සේවා සැපයීම සදහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොයෙදවීම, සේවයේ අසතුටුදායක බව හෝ වෙනත් පැමිණිල්ලක් විභාග කිරිමට ඇති බලය ඉහත ආයතන සතු වන අතර ආයතන ප්‍රධනියා ඒ සදහා සුදුසු දඩ මුදලක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලබන අතර, ඒ දඩ මුදල ගෙවිමට සේවා සැපයුම්කරු බැදී සිටී.

18. සේවා සැපයීම හා ඒ සම්බන්ධ තත්වයන් දිගින් දිගටම අසතුටුදායක වේ නම් අදාල සේවා සැපයුම්කරුගේ කොන්ත්‍රාත්තුව අවලංගු කිරිමට ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාට බලය ඇත. එසේම එයට යටත් විමට සේවා සැපයුම්කරු බැදී සිටි.

19. පඩි පාලක සභා ආඥ පනත අනුව කම්කරු කොමසාරිස් විසින් නියම කර ඇති ආරක්ෂක සේවා සැපයීම සදහා එක් සේවකයෙකුට ගෙවිය යුතු අවම වැටුප සහ අනෙකුත් ව්‍යවස්ථාපිත දිමනා නියමිත පරිදි ගෙවිමට මෙම සේවා සැපයුම්කරු සහතික විය යුතු අතර එසේ කම්කරු කොමසාරිස් විසින් දැනට නියම කර ඇති අවම වැටුප හා ව්‍යවස්ථාපිත දිමනා වලට අඩු වැටුප් හා දීමනා ගෙවිම් සදහන් කර ඇති සැපයුම් කරුවන්ගෙන් ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

20. මිල ගණන් ඉදිරිපත් කිරීමේදි, (ඇමුණුම IV, IV (I) හා IV (II) 2024 අංක 48 දරණ ජාතික අවම වේතන (සංශෝධන) පනතේ නියමයන්ද, පඩිපාලක සභා අඥා පනතේ (136 වන අධිකාරය) ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභා තීරණ සහ තත්කාලීනව බලපවත්වන්නා වු අනෙකුත් නීතිරීති වලට අදාල ව්‍යවස්ථාපිත ගෙවීම් හා දායක මුදල් යනාදියද ඇතුලත් වන පරිදි සිදු කළ යුතුය.

21. එකම සේවකයා අවුරුද්දේ දින 365 සේවයේ යොදවන සේ නොසලකා මිල ගණන් ඉදිරිපත් කල යුතුය.

22. ස්ත්‍රීන් රාත්‍රී සේවයේ යෙදවිමේදී ස්ත්‍රීන්, ළමුන් හා තරුණ අය සේවයේ යෙදවිමේ පනත අනුව කටයුතු කල යුතුය.

23. නිල ඇඳුම්, සපත්තු, කුඩ, වැහි කබා, හෙල්මට්/කැප්, හැඳුනුම්පත් හා පෞද්ගලික ආරක්ෂක උපකරණ ආදිය සේවා සම්පාදක විසින් ආරක්ෂක නියාකමක/ පාලක වෙත සැපයිය යුතු අතර, ඒවා පැළඳ රාජකාරි නිරත විමට කටයුතු කල යුතුය. නිල ඇඳුමේ පාට හා ඡායාරූපයක් ලංසු ආකෘති පත්‍ර සමඟ ඉදිරිපත් කල යුතුය.

24. සෑම විටම වයස අවුරුදු 18-60 අතර සේවකයින් පමණක් සේවයේ යදවිය යුතු අතර, ඊට පටහැණිව සේවකයින් සේවයේ යෙදවුවහොත්, ඒ බව සනාථ වූ පළමු අවස්ථාවේදීම ගිවිසුම උල්ලංඝණය කළා සේ සලකා කටයුතු කරන බවට වූ කොන්දේසිය පිළිබඳව අවබෝධයෙන් යුතුව මෙම ආරක්ෂක සේවා සැපයීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ විය යුතුය.

## ලංසු ඇගයීමේ නිර්ණායක.

I. පඩි පාලක සහා ආඥා පනත, අවම වේතන පනත, අයවැය සහන දීමනා පනත අනුව අවම වැටුප් හා දීමනා ගෙවීම් සිදු කරන්නේද යන වග. ශ්‍රම පිරිවැය ගණනය කිරීම ඇමුණුම IV – (I) සහ IV – (II) සඳහන් ආකෘති පත්‍ර ප්‍රකාරව ගණනය කල යුතු අතර, නියමිත ආකෘති පත්‍රයන් බැහැරව ගණනය කරන ලද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. එමෙන්ම, සතියේ දින හතම (7) එකම සේවකයා සේවයේ යොදවන බව සලකා වැටුප් ගණනය කිරීම සිදු කරනු ලබයි. වෙනත් ආකාරයකට සේවකයන් යොදවමින් වැටුප් ගෙවීම සිදු කරනු ලබන අවස්ථාවල ලංසු ආකෘති පත්‍රයේ ඒ බව පැහැදිළි කිරීමක් කර නොමැති නම්, එකම සේවකයා සතියේ දින හතම සේවයේ යොදවනු ඇතැයි සලකා කටයුතු කරනු ලැබේ.

II. ප්‍රවර්ථන වර්ෂය සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශයේ වලංගු ලියාපදිංචිය ලබා ගෙන තිබේද යන වග.

III. නියමිත වටිනාකමට හා දිනට ලංසු ඇපකර ඉදිරිපත් කර තිබේද යන වග.

IV. ඔබ විසින් ඉල්ලුම් කරනු ලබන රෝහල/ සෞඛ්‍ය ආයතනය සඳහා සේවයේ යෙදවිය යුතු සේවක සංඛ්‍යාවට අතිරේකව කාර්ය මණ්ඩලයට සේවකයින් අවශ්‍ය කාර්ය මණ්ඩලයෙන් 10% සිටින බවට අදාල ලේඛන අනුව සනාථ කළ යුතුය. එක් ආයතනයකට වඩා ලංසුඉදිරිපත් කර තිබේ නම් ඒ සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සිටින බව සනාථ කළ යුතුය.

V. සේවා පලපුරුද්ද තිබේද යන වග. අවම සේවා පළපුරුද්ද පහත පරිදි විය යුතුය.

| අ/අ | පැකේජ අංක | අවශ්‍ය අවම පළපුරුද්ද |
|---|---|---|
| 01 | 01 හා 02 | සමාන ධාරිතාවයකින් යුතු ආයතනයක වසර 03ක ආරක්ෂක සේවා සපයා සේවා පළපුරුද්ද ලබා තිබීම. (මෙම පැකේජ යටතේ ඉල්ලා ඇති ආරක්ෂක නියාමකයන් ප්‍රමාණයක් හෝ ආසන්න ප්‍රමාණයක් සේවයේ යොදවා තිබිම සනාථ කළ යුතුය.) |
| 02 | 03,04,05,06,10 | සමාන ධාරිතාවයකින් යුතු ආයතනයක වසර 02ක ආරක්ෂක සේවා සපයා සේවා පළපුරුද්ද ලබා තිබීම. (මෙම පැකේජ යටතේ ඉල්ලා ඇති ආරක්ෂක නියාමකයන් ප්‍රමාණයක් හෝ ආසන්න ප්‍රමාණයක් සේවයේ යොදවා තිබිම  තිබිම සනාථ කළ යුතුය.) |
| 03 | 07,08,09 | සමාන ධාරිතාවයකින් යුතු ආයතනයක වසර 01ක ආරක්ෂක සේවා සපයා සේවා පළපුරුද්ද ලබා තිබීම. (මෙම පැකේජ යටතේ ඉල්ලා ඇති ආරක්ෂක නියාමකයන් ප්‍රමාණයක් හෝ ආසන්න ප්‍රමාණයක් සේවයේ යොදවා තිබිම තිබිම සනාථ කළ යුතුය.) |

*ආසන්න ප්‍රමාණය යනුවෙන් සළකනු ලබන්නේ 75%ක් හෝ ඊට වැඩි ප්‍රමාණයකි.

VI. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සන්නද්ධ සේවාවන් හා පොලිසියේ සේවාවන් හැරගිය පුද්ගලයන් සේවයේ යොදවා නොමැති බවට සහතිකයක් (ලංසුකරු විසින්)

VII. අසාදු ලේඛන ගත කරන ලද සැපයුම්කරුවෙකු නොවිය යුතුය.

VIII. ලංසු පත්‍රය සමග එහි සඳහන් කර ඇති අනෙකුත් ලියකියවිලි නිවැරදිව ඉදිරිපත් කර තිබේද යන්න.

IX. (A) A ශ්‍රේණියේ මූලික රෝහල් හා සෞඛ්‍ය ආයතන සඳහා වන පැකේජයන් සඳහා පසුගිය වර්ෂ ආසන්න 03 ක (2021/2022, 2020/2023, 2023/2024) රුපියල් මිලියන 14 ක සාමාන්‍ය පිරිවැටුමක් තිබිය යුතු අතර, එක් ආයතනයකට වැඩි ප්‍රමාණයක් සඳහා ලංසු ඉදිරිපත්

කරන්නේ නම් එම සියළුම එකතුවට සමාන හෝ වැඩි මුදලක් පසුගිය වසර 03 ක සාමාන්‍ය පිරිවැටුපක් පවතින බවට සනාථ කළ යුතුය. මේ සඳහා පසුගිය ආසන්න වසර 03 ක විගණනය කරල ලද ගිණුම් වාර්තා ඉදිරිපත් කළ යුතුය. ලංසු මුදලින් 40% ක මුදලකට සමාන මුල්‍ය හැකියාවක් පවතින බවට ස්ථාවර තැන්පතු හෝ ණය/ අයිරා පහසුකම් සපයා ගැනීමට හැකි වන බවට මුල්‍ය ආයතනය මගින් තහවුරු කර ඉදිරිපත් කළ යුතුය.

(B) B ශ්‍රේණියේ මූලික රෝහල් හා අනෙකුත් පැකේජයන් සඳහා රුපියල් මිලියන 08ක පිරිවැටුමක්ද ඉහත (A) යටතේ සඳහන් අනෙකුත් කොන්දේසි ද සම්පූර්ණ කළ යුතුය.

X. ඔබ විසින් සඳහන් කරනු ලබන සේවක සංඛ්‍යාව කම්කරු දෙපාර්තමේන්තුවට, සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් ගෙවනු ලබන සේවකයින් සංඛ්‍යාව සමග සැසඳිය යුතු වේ. 2024 වර්ෂයේ ආසන්න මාස 03 ක වාර්තා සමඟ පසුගිය වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සේවක අර්ථ සාධක අරමුදල් ගෙවීම් ලදුපත්.

XI. රාජ්‍ය/අර්ධ රාජ්‍ය/සංස්ථා/මණ්ඩල යනාදිය වෙත ආරක්ෂක සේවා සපයා ලබා ගන්නා ලද සේවා ඇගැයුම් සහතික.

XII. ලංසු ඇගයිම ඉදිරිපත් කර ඇති ඇගැයුම් දර්ශකයට අනුව සිදු කරනු ලබන අතර, ඒ සඳහා අවශ්‍ය සියලු විස්තර ඉදිරිපත් කළ යුතුය.

XIII. ආරක්ෂක සේවාවන්ට අදාල ගණනය කිරිමේදී,ලංසු ඇගැයිමේ ක්‍රමවේදය ලංසු මත බර තැබිමද සලකා බලනු ලැබේ.(ඇමුණුම - V ,VI)

XIV. රුපියල් මිලියන 05 වැඩි වටිනාකම් සහිත ලංසු සඳහා සමාගම් රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් ලබා ගන්නා ලද පොදු කොන්ත්‍රාත් ගිවිසුම.(PCA 3)

XV. සාරානුකූල ප්‍රතිචාර දක්නා ඇති, ඇගයීම් කරන ලද, අවම මිල ගණන් සමාන වන අවස්ථා වලදී ලංසු ප්‍රධානය කිරීම සම්බන්ධයෙන්, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති ප්‍රසම්පාදන අත්පොත - 2024 හි විධිවිධාන අනුව කටයුතු කරනු ලැබේ.

XVI. ප්‍රසම්පාදන අත්පොත - 2024 හි ප්‍රසම්පාදන මාර්ගොපදේශ 1.5 වගන්තියට අදාළව ඇමුණුම් III හි වන දුස්සන්ධානීය නොවන බවට වන දිවුරුම් ප්‍රකාශය සම්පූර්ණ කර, නියමිත වටිනාකමට මුද්දර අලවා විධිමත් පරිදි සම්පූර්ණ කර ලංසු ලේඛන සමග ඉදිරිපත් කළ යුතුය. (මෙම ආකෘතිය මෙම ලේඛනයට ඇතුළත් කර ඇත)

**<u>ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන රෝහල්/සෞඛ්‍ය ආයතන සඳහා 2026/2027 වර්ෂයේ ආරක්ෂක සේවා සැපයීම.</u>**

**01.** පහත දැක්වෙන කොන්දේසි වලට අනුකූලව කොන්ත්‍රාත් ගිවිසුමෙන් එකඟ වන්නා වූ දින සිට වර්ෂයක් සඳහා ඌව පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන රෝහල් හා සෞඛ්‍ය ආයතන සඳහා ආරක්ෂක සේවා සැපයීමට සෞඛ්‍ය සේවා සෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් ලංසු කැඳවනු ලැබේ.

**02.** සම්පූර්ණ කරනු ලබන ලංසු අයදුම්පත් පිටපත් දෙකකින් පිළියෙල කර කවරවල බහා සීල් තබා පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ, ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හැකිය. ලංසුපත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ආරක්ෂක සේවා සැපයිම 2026/2027" යනුවෙන් සඳහන් කර ආයතනයේ නම හා පැකේජ් අංකයද සඳහන් කළ යුතුය. එක් එක් ආයතනය සඳහා ඉදිරිපත් කරනු ලබන ලංසු පිටපත් දෙකක් වෙන් වෙන්ව පිළියෙල කර ඒවා "මුල් පිටපත" හා " අනු පිටපත" යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර මුද්‍රා තබා ඉදිරිපත් කල යුතුය. (එක් ආයතනයට වැඩි ආයතන ගණනක් සඳහා ලංසුපත් ඉදිරිපත් කරන්නේ නම්, ලංසුපත් සමඟ ඉදිරිපත් කළ යුතු පළපුරුද්ද, ගිණුම් ප්‍රකාශන වැනි සෑම ලේඛනයක්ම ඇතුලත් එක් ලේඛන කට්ටලයක් වෙනම ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.)

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය,
ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
අංක 301, ආර්එච්.ගුණවර්ධන මාවත,
බදුල්ල.

**03.** ලංසු බැඳුම්කරය

**i.** ලංසු ප්‍රධානය කිරීමේ කටයුතු නිම කිරීමෙන් පසුව සාර්ථක ලංසුකරුගේ ලංසු බැඳුම්කරය හැර අනෙකුත් අයදුම්කරුවන්ගේ ලංසු බැඳුම්කරය නිදහස් කරනු ඇත. අදාල කාර්ය සාධන ඇපකරය සහ කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරිමෙන් පසුව කොන්ත්‍රාත්කරුවන්ගේ ලංසු ඇපකරය නිදහස් කරනු ඇත.

**ii.** මිල ගණන් ප්‍රතික්ෂේප කිරීම හෝ පිළිගැනීමට ප්‍රසම්පාදන මණ්ඩලයට ඇති බලය , සාධාරණ හා නීත්‍යානුකූල හේතුන් මත පෞද්ගිලක ආරක්ෂක සේවා සැපයීම සඳහා ඉදිරිපත් කර ඇති කිසියම් ලංසුවක් හෝ ලංසු සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය සතුය.

**04.** ආරක්ෂක සේවාවල වගකීම

**i.** සාර්ථක කොන්ත්‍රාත්කරු ගිවිසුම මඟින් සැපයීමට එකඟ වූ සේවා නොඅඩුව සහ පරිපූර්ණව සැපයිය යුතුය. ආරක්ෂක සේවයේ ස්ථාන භාර නිලධාරින් සහ ආරක්ෂක නියාමකයින් සුදුසු ප්‍රසන්න නිල ඇඳුමකින් සැරසී සිටිය යුතු අතර, තම ආයතනයේ හැඳුනුම්පත් පැලඳ සිටිය යුතුය.

දිනපතා එක් එක් සේවා වැඩමුරය ආරම්භ කිරීමට ප්‍රථම එම වැඩමුරය සඳහා එක් එක් ස්ථානයේ යොදවනු ලබන ආරක්ෂක සේවා සැපයිමේ කාර්ය මණ්ඩලයේ නම් ලැයිස්තුවක් ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය. (හැඳනුම්පත් අංක සහිතව) එසේම ඔවුන් නියමිත ස්ථානයන්හි සේවයේ යෙදවිය යුතුය. එසේම ඔවුන් නියමිත අඩුවෙන් සපයන සේවකයින් සඳහා

දඩයක් වශයෙන් එක් සේවකයෙක් සඳහා රු.250/- ක මුදලක් සේවා සැපයුම්කරුගේ අයකරනු ලැබේ.

iii. පළාත් සෞඛ්‍ය අධක්ෂකවරයා විසින් ඉල්ලා සිටිය හොත් ආරක්ෂක සේවයේ නියුතු ආරක්ෂක නියාමකයින් සහ ස්ථානභාර ආරක්ෂක නිලධාරීන් සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම් සහතික කරන ලද ග්‍රාම සේවා සහතිකයක් හෝ පොලීසියෙන් ලබා ගත් සහතිකයක් ඉදිරිපත් කිරීමට ආරක්ෂක සේවා සපයන ආයතනය සූදානමින් සිටිය යුතුය.

iv. වැඩ කරන සෑම දිනකම ආහාරය සඳහා පැයක කාලයක්ද ඇතුලුව පැය 12ක සේවා මුරයක් ක්‍රියාත්මක කළ යුතු අතර, කිසිඳු ආරක්ෂක නියාමකවරයෙකු, ස්ථානභාර ආරක්ෂක නිලධාරියෙකු, එක් විටකදී අඛණ්ඩව පැය 24කට වඩා වැඩියෙන් සේවයේ නොයෙදිය යුතුය. සේවයේ යොදවා ගන්නා සේවකයින්ට පැය 09 කට වැඩියෙන් සේවය කරන කාලයට අතිකාල දීමනා ගෙවිය යුතුය. (දිවා ආහාරය හා විවේකය සඳහා පැය 01ක කාලය ඇතුළුව)

v. සේවයෙහි යෙදෙන ආරක්ෂක කාර්ය මණ්ඩලය තමන්ගේ වැටුප් ලබාගැනීම හෝ වෙනත් අවශ්‍යතා සඳහා තම සේවා ස්ථානයේ බැහැරව යාමට සිදුවන අවස්ථාවලදී ඔවුන් මුදාහැරීමට පෙර එම ස්ථාන වලට ආදේශක ආරක්ෂක නියාමකයන් යෙදවිය යුතුය.

vi. ආරක්ෂක සේවා භාරගනු ලබන ආයතනයේ භූමි භාගය සහ එහි පිහිටි සියළුම චංචල නිශ්චල දේපල සහ වත්කම් වලට කිසිම හානියක් නොවන ආකාරයෙන් කටයුතු කිරීම ආරක්ෂක සේවා සපයන ආයතනයේ වගකීම වේ. සේවා ආයතනයේ කිසියම් වත්කමක් නැතිවීම හා අලාභ හානි කිරීම සම්බන්ධයෙන් එම ආයතනයේ ආරක්ෂක සේවාව සපයන ආයතනය වගකිව යුතු බව අනාවරණය වුවහොත් එමඟින් රජයට සිදුවන පාඩුව ආරක්ෂක සේවාවේ මාසික ගෙවීම් වලින් අඩුකර ගැනීමට සේවා ලබන ආයතනයේ ආයතන ප්‍රධානියාට බලය ඇත.

vii. ආරක්ෂක සේවයේ සියළුම ආරක්ෂක නියාමකයින් සහ ස්ථානභාර ආරක්ෂක නිලධාරීන් අදාල ආයතනයේ නිලධාරීන්ට සහ මහජනයාට ආචාරශීලි හා විනීතව කටයුතු කළ යුතු අතර, මනා විනයකින් යුක්ත විය යුතුය.

viii. සේවයේ යොදවනු ලබන ආරක්ෂක නිලධාරීන් සඳහා අවශ්‍ය නිල ඇඳුම් , වැහි කබා, සපත්තු, විදුලි පන්දම් උපකරණ, ලිපි ද්‍රව්‍ය හා වෙනත් අවශ්‍යතා ආරක්ෂක සේවා සපයන ආයතන විසින් සපයා ගත යුතුය. (ස්ථානභාර ආරක්ෂක නිලධාරීන් හා ආරක්ෂක නියාමකයින් සේවා කාලය තුල පූර්ණ නිල ඇඳුමින් සැරසී සිටිය යුතුවේ.)

ix. තෝරාගත් ආරක්ෂක සේවා ආයතනය විසින් තම අයඳුම්පතේ ඇතුලත් කරන ලද ආරක්ෂක සේවා සැපයීමේ ආරක්ෂක නියාමකයින් හා ස්ථානභාර ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව නියමිත ස්ථානයන්හි යෙදවිය යුතුය.

x. ආරක්ෂක සේවා ආයතනයන්හි හෝ අනුබද්ධ ආයතනවල හෝ කාර්ය මණ්ඩල වල සාමාජිකයින්ගේ සමීප ඥාතීන් මෙම කොන්ත්‍රාත්තුවට අදාල ආයතනවල ආරක්ෂක සේවාව සඳහා නොයෙදවිය යුතු අතර , සේවය කරන ආයතනයේ කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ ඉල්ලීම අනුව සේවකයින් බඳවා ගැනීම නොකල යුතුය. පෙර නොදැනුවත්ව හෝ බඳවාගත් එවැනි පුද්ගලයෙක් වේ නම් එසේ දැනගත් වහාම අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති ආයතනවල සේවයෙන් එම පුද්ගලයා ඉවත් කල යුතුය.

## 05. ශක්‍යතාව ඔප්පුකිරීම

සැපයුම්කරුවන් තම අයඳුම්පත් සමඟ අපේක්ෂිත කටයුතු ඉටුකිරීමේ හැකියාව සම්බන්ධයෙන් පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

## 06. නීතිය අදාල වීම

මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පිරිනැමෙන කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බල පැවැත්වෙන නීතිය අදාල වන අතර, මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඇතිවන ආරවුල් විසඳීම පිළිබඳ 1995 අංක 11 දරණ පනතේ විධිවිධාන පරිදි සිදුකරනු ලැබේ.

07. ආරක්ෂක සේවා සැපයිය යුතු ස්ථාන යනුවෙන් හඳුන්වනු ලබන්නේ ලංසුපත්‍රයේ දක්වා ඇති සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට හා අනුබද්ධ ආයතන සඳහා අවශ්‍ය ආරක්ෂක නියාමකයින් හා ස්ථානභාර ආරක්ෂක නිලධාරින් සේවයේ යෙදවිය යුතු ස්ථානයන් වේ.

08. ගෙවීම

සියලුම අයවීම් පිළිබඳ විස්තර දින 30ක් ඇතුළතදී ගෙවීම් බලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුය. දෙසැම්බර් මස අයවීම් විස්තර මුදල් වර්ෂ අවසන් කරනු ලබන දිනට වැඩ කරන ලබන දින 3 කට කලින් ඉදිරිපත් කළ යුතුය. මෙකී දිනට පසුව ඉදිරිපත් කරනු ලබන අයවීම් විස්තර සම්බන්ධයෙන් ගෙවීම් ප්‍රමාද වනු ඇත.

09. කොන්ත්‍රාත්තුව අවසන් කිරීම

පහත දැක්වෙන කරුණු හා ආයතනයේ ආරක්ෂක සේවාවට අයහපත් ලෙස බලපාන වෙනත් කරුණු මත කොන්ත්‍රාත්තුව මුළුමනින්ම හෝ එහි කොටසක් වශයෙන් හෝ අවසන් කිරීමටත් පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාට බලය ඇත.

I. ආරක්ෂක සේවාවන්ට අයත් නොවන පුද්ගලයන් ආයතන තුල අනවශ්‍ය ලෙස රඳවා ගැනීම.
II. පැමිණීමේ ලේඛන නියමිත ලෙස අත්සන් නොකිරීම.
III. ව්‍යාජ අත්සන් යෙදීම.
IV. කොන්ත්‍රාත්තුව මඟින් නියම කරන ලද ආරක්ෂක නියාමකයින් හා ස්ථානභාර ආරක්ෂක නිලධාරින් සංඛ්‍යාව සේවයේ නොයෙදවීම.
V. ආරක්ෂක සේවා ලබා ගන්නා ආයතනයේ හෝ කාර්යාල ඉඩකඩ අනිසි ලෙස පරිහරණය කිරීම.
VI. සේවා ආයතනයේ දේපල වලට හානි කිරීම.
VII. කොන්ත්‍රාත් ගිවිසුමෙන් එකඟ වූ කාරණයන් නිසි පරිදි ඉටු නොකිරීම.
VIII. ආරක්ෂක නියාමකයින්/ ප්‍රධාන ආරක්ෂක නිලධාරින් කාර්ය මණ්ඩල හා මහජනතාවට සමඟ අනවශ්‍ය අර්බුධ හෝ ගැටුම් ඇති කර ගැනීම.
IX. වැඩ වර්ජන හෝ වෘත්තිය ක්‍රියාමාර්ග හේතුවෙන් පැය 48කට වැඩි කාලයක් අඛණ්ඩව සේවා සැපයිමට අපොහොසත් විම.
X. වයස අවුරුදු 18ට අඩු හෝ අවුරුදු 60 වැඩි සේවකයින් සේවයේ යෙදවීම.
XI. දෙපාර්ශවයේ එකඟතාවය මත.

10. කොන්ත්‍රාත්තුවේ සේවා කාලය දීර්ඝ කිරීම.

නව කොන්ත්‍රාත්තු කරුවෙක් තෝරා ගන්නා තෙක් අවශ්‍ය වන්නේ නම් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය හා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ එකඟතාවය ඇතිව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයට සේවයේ නියුතු කොන්ත්‍රාත්කරුගේ ගිවිසුමේ නියම කර ඇති කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කිරීමට පුළුවන. ඒ සඳහා ගිවිසුම්ගත එම අවස්ථාවල දී ඒ සඳහා ගිවිසුම්ගත වූ මුදලට සමානුපාතිකව අදාළ කාලපරිච්ඡේද සඳහා ගෙවීම් සිදුකෙරේ

11. පොදු විධි විධාන

1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පණත හා ඒ පිළිබඳව කුමන හෝ ව්‍යවස්ථාපිත සංශෝධන වෙනස් කිරීම් හෝ දීර්ඝ කිරීම් යටතේ කොන්ත්‍රාත්කරුගේ කවර හෝ සේවකයෙකු සම්බන්ධයෙන් ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් වග කියනු නොලැබේ.

12. කොන්ත්‍රාත්කරුවන් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි පිළිබඳව මනා අවබෝධයක් ලබාගත යුතුය. තොරතුරු නොදැන සිටීම සම්බන්ධයෙන් කරනු ලබන කිසිදු ඉල්ලීමක් පිළිගනු නොලැබේ.

13. ලංසු පත්‍රයේ සඳහන් ආරක්ෂක සේවාවන් වෙනත් ආකාරයකින් ලබාගැනීම පිණිස වෙනත් වැඩ පිළිවෙළක් යෙදීම වඩා යෝග්‍ය යැයි සිතන්නේ නම් මෙම ගිවිසුම නොසලකා එසේ කිරීමට ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාට බලය ඇති අතර, ඒ පිළිබඳව ලිත් මාසයකට පෙර අදාල කොන්ත්‍රාත්තුකරු ලිඛිතව දැනුවත් කල යුතුය. ඒ පිළිබඳ අලාභ ඉල්ලා සිටීමට කොන්ත්‍රාත්තුකරුට අයිතියක් නොමැත.

14. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අනුබද්ධ ආයතන සහ පෞද්ගලික ආරක්ෂක සේවා සැපයීමේදී ආරක්ෂක සේවාවේ අඩුපාඩු සම්බන්ධයෙන් පහත සඳහන් දඩ මුදල් නියම කරනු ලැබේ. මෙම අඩු කිරීම් නැවත සේවකයාගේ වැටුපෙන් අඩුකිරීම කොන්ත්‍රාත්තුකරු විසින් නොකළ යුතුවේ.

I. රාජකාරි ස්ථානයේ රැදී නොසිටීම වෙනුවෙන් පැය භාගයක කාලයක් සඳහා එක් පුද්ගලයෙකුට රු.100 බැගින් (උපරිමය දිනක වැටුප වේ.)
II. එක් එක් දිනයේ සේවයේ යෙදවිය යුතු නියමිත ආරක්ෂක සේවකයින් සංඛ්‍යාව සේවයේ නොයෙදවීම සඳහා එක් පුද්ගලයෙකුට රු.250/- බැගින් අඩු කිරීම.
III. රාජකාරියේ යෙදී සිටින ආරක්ෂක සේවකයන් පූර්ණ නිල ඇඳුමින් සැරසී සිටිය යුතුය. එසේ නොසිටීය හොත් එක් පුද්ගලයෙකුගෙන් දිනකට රු.500/- බැගින් අඩු කිරීම.
IV. රාජකාරි වේලාව තුල බුලත් හැපීම හා දුම්වැටි භාවිතයෙන් වැලකී සිටිය යුතු අතර, එසේ නොවන්නේ නම් එක් පුද්ගලයෙකුගෙන් දිනකට රු.500/- බැගින් අඩු කිරීම.

15. ආරක්ෂක කාර්ය මණ්ඩලය ආරක්ෂක සේවා පවරා ඇති රෝහල් / ආයතන භූමියේ සිදු කරන සොරකම් සම්බන්ධයෙන් සහ උපකරණවලට සිදු කරන අලාභ හානි කිරීම් සම්බන්ධයෙන් රජයට සිදුවන පාඩු පිළිබඳව එම භාණ්ඩයේ වර්ථමාන වෙළඳපළ වටිනාකමට අමතරව 25% ක දෙපාර්තමේන්තු ගාස්තු ද ඇතුලත්ව කොන්ත්‍රාත්කරුගෙන් අය කිරීම.

16. ආරක්ෂක සේවා කරගෙන යාමේදී කොන්ත්‍රාත්කරුගේ පරීක්ෂණ මහතුන් විසින් කරනු ලබන අධීක්ෂණ කටයුතු වලට අමතරව ආරක්ෂක සේවාවේ රාජකාරි ඉටු කිරීම පිළිබඳව විටින් විට ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් පරීක්ෂා කරනු ඇත.

17. කොන්ත්‍රාත්කරු විසින් ඇප වශයෙන් තැන්පත් කරනු ලබන මුදල් වලට කිසිදු පොලියක් ගෙවනු නොලැබේ.

18. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරනු ලබන රෙගුලාසි මත ගෙවිය යුතු වන බදු ගෙවීමට කොන්ත්‍රාත්කරු යටත් වනු ඇත.

19. ලංසු ඉදිරිපත් කරන ආයතනය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතනයක් විය යුතුය.

20. කොන්ත්‍රාත්කරු යටතේ සේවයේ යොදවන ලද සේවකයින් කම්කරු දෙපාර්තමේන්තුවේ සියළු නිතිරිති වලට අනුකූලව සේවයේ යෙදවිය යුතු අතර, ඔවුන්ට වැටුප්, නිවාඩු දින වැටුප්, අතිකාල, පාරිතෝෂික, ප්‍රසූතිකාධාර, සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල, වෙනත් දීමනා හා වෙනත් සියළුම ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම් පිළිබඳ වගකිම ආරක්ෂක සේවා සැපයිමේ

කොන්ත්‍රාතකරු විසින් දැරිය යුතු වේ. මේ පිලිබඳ වගකීමට ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව හෝ ඒ යටතේ පවත්නා ආයතන බැදී නොසිටි.

වෙනත් කරුණු :

I. පැය 12ක සේවා වැඩමුර ක්‍රමයක් ක්‍රියාත්මක කල යුතුය. එය පහත පරිදි විය යුතුය.
   - පළමු සේවා මුරය. පෙව.ව 6:00 - ප.ව 18:00.
   - දෙවන සේවා මුරය. - ප.ව. 18:00 - පසු දා පෙ.ව. 6:00.

II. රෝහල්/ ආයතන ආරක්ෂක සේවාව සැපයීම ඉතා උසස් මට්ටමින් පවත්වාගෙන යාම.

III. අදාල ආයතනයේ/ රෝහල් ප්‍රධානියාගේ උපදෙස් පරිදි රෝහල / ආයතනය නිරන්තරව ආරක්ෂාව සැපයීම සම්බන්ධ හොඳ තත්ත්වයෙන් පවත්වාගෙන යාම ලංසුකරුගේ වගකීම වේ. ආරක්ෂාව සැපයිය යුතු ආකාරය පිළිබඳ උපදෙස් ප්‍රධානියා විසින් ලබා දෙනු ලැබේ.

IV. රෝහලේ/ආයතනයේ ප්‍රධානින් විසින් දක්වා ඇති සියලු ස්ථාන සඳහා ආරක්ෂක නියාමකයින් යෙදවිය යුතුය.

V. රෝහලේ/ආයතනයේ භූමිය, ගොඩනැගිලි හා ඊට ඇතුලත් සියලුම දෑ සඳහා ආරක්ෂාව සැපයිය යුතුය.

VI. අභියාචනා සලකා බැලීම. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් සකස් කර ඇති ප්‍රසම්පාදන අත්පොත - 2024 හි දක්වා ඇති විධිවිධානත්, ඌව පළාත් සභා මුදල් රීති 705.5 හි විධිවිධාන අනුවත් සිදුකෙරේ.

සභාපති
ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව.
අංක 301, ආර්.එච්.ගුණවර්ධන මාවත,
බදුල්ල.